# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013-10-31

**වේලාව** : පෙ.ව. 10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නගර සභා මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නගර සභා මන්ත්‍රී | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | ගරු නගර සභා මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නගර සභා මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එය කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළුම දෙනා ඉතාමත් සාදරයෙන් පිළිගන්නා බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදී. පෙ.ව. 9.00ට මෙදින මහා සභා රැස්වීම පැවැත්වීමට සැලසුම් කර තිබුණත්, පැවති විශේෂ සාකච්ඡාවක් හේතුවෙන් පැයක් පමණ ප්‍රමාද වීම සම්බන්ධ හා අඟහරුවාදා දිනට නියමිතව තිබූ රැස්වීම බ්‍රහස්පතින්දා දිනයට යොදා ගැනීම හේතුවෙන් සිදුවූ අපහසුතාවය සම්බන්ධව ගරු උප සභාපතිතුමන් ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සමාව ඉල්ලන බව එතුමන් විසින් දක්වන ලදී.

මෙම සභාවේ වැඩකටයුතු ඉතාමත් සාර්ථක අන්දමින් නිම කිරීමට හැකි වූ බව ද, සභා කර්මාන්ත වලින් 80%ක් නිම කර ඇති අතර, නඩත්තු සඳහා වෙන් කළ මුදලින් ද 80% කින් වැඩ කර ඇති බව ද, මග නැගුම හා ගම නැගුම ව්‍යාපෘති යටතේ ලැබුණු සංවර්ධන වැඩසටහන් ද විශාල ප්‍රමාණයක් නිමාවට පත් කර ඇති බව ද, පළාත් සභා ආධාර යටතේ වන කර්මාන්ත ද මේ වන විට අවසන් කර ඇති බව ද, UN HABITAT ආයතනයේ ආධාර මත සිදුකරන දොරවෙල ඔය ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය ද මේ වන විට නිම කිරීමට හැකියාව ලැබී ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී.

UN HABITAT ආයතනය මගින් සිදුකරන ආපදා අවම කිරීම සහ දේශගුණ විපර්යාස සම්බන්ධ සමුළුවේ දී බලන්ගොඩ නගර සභාවට කථාවක් කිරීමේ අවස්ථාව ලැබුණු බව ද, ඔස්ට්‍රේලියානු මහකොමසාරිස්තුමිය සහ ආපදා කළමනාකරණ අමාත්‍යතුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් පැමිණ සිටි එම උත්සවයේ දී මෙම නගර සභාව ප්‍රශංසාවට ලක් වූ බව ද එය මෙම නගර සභාවට අභිමානයක් බව ද, ගරු උප සභාපතිතුමන් විසින් ඉතා හොඳින් එම ඉදිරිපත් කිරීම සිදු කළ බව දැන ගැනීමට ලැබුණු බව ද, ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. ජනවාරි මාසයේ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් ජල බවුසරයක්, විදුලි උත්පාදක යන්ත්‍රයක් සහ ජල මෝටර දෙකක් මෙම සභාව වෙත ලබා දීමට නියමිත බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

දොරවෙල ඔය ඉවුරු සංවර්ධන ව්‍යාපෘතියට අදාලව UN HABITAT ආයතනය විසින් නිකුත් කර ඇති වාර්තාව මගින් නගරයේ සංවර්ධනයට සහ ආපදා අවදානම අවම කිරීමට අදාල බොහෝ වැදගත් තොරතුරු ලබා ගැනීමට හැකි බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

2013 නොවැම්බර් මස 14 සිට 16 වන දින දක්වා ආසියා පැසිෆික් කලාපයේ ආපදා කළමනාකරණයට අදාල රැස්වීමක් සඳහා පිලිපීනයේ මැනිලා නගරයේ දී සහභාගී වීමට තමන්ට සහ මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා හට ආරාධනා ලැබී ඇති බව ද, ඒ හේතුවෙන් සහ පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි නියෝජිතයා වශයෙන් ඌව පළාත් සමුළුවට සහභාගී වීම ඇතුළු වැඩසටහන් ගණනාවකට එම මාසය තුළ ආරාධනා ලැබී තිබීම හේතුවෙන් පෞද්ගලික විදේශ සංචාරය අවලංගු කිරීමට තීරණය කළ බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

නගර අලංකරණය සඳහා රු. ලක්ෂ 05ක මුදලක් පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙතින් මෙම නගර සභාවට ලැබී ඇති බව ද, මොහාන් සාලිය එල්ලාවල මාවත මල් පෝච්චි තබා අලංකරණය කිරීමට මෙමගින් හැකියාව ලැබෙන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

තමන් දිවයිනේ නොමැති අවස්ථාවේ දී ගරු උප සභාපතිතුමන් අදාල රාජකාරී කටයුතු ඉතාමත් හොඳින් ආවරණය කර ඇති බව ද, වෙනත් සභාවන්හි එම ලක්ෂණය දක්නට නොලැබෙන බව ද එතුමන් සඳහන් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් උප සභාපතිතුමන් හට තම ස්තුතිය පළ කරන බව ද පැවසීය.

සභාවට තමන් පැමිණ නොමැති අවස්ථාවල දී, ගරු උප සභාපතිතුමන් හෝ, එතුමන් ද නොමැති විට ජ්‍යෙෂ්ඨත්වයේ ඊළඟට සිටිනා ගරු මන්ත්‍රීතුමන් හෝ මුලසුන දරමින් ගණපූරණය පවතී නම් සභා රැස්වීම පැවැත්විය යුතු බව ද, ඒ ආකාරයෙන්ම සභාවේ නිලධාරීන් ද, එක් අයකු නොමැති නම්, ඒ කාර්යය සඳහා ඊළඟට සිටින නිලධාරියා විසින් එම රාජකාරි කටයුතු ආවරණය සිදු කළ යුතු බව ද, සභාවේ න්‍යාය පත්‍රයෙන් පිට යමක් සාකච්ඡා වන්නේ නම් ඒ කිසිවක් නීත්‍යානුකූල නොවන බව ද, න්‍යාය පත්‍රයෙන් පිට සාකච්ඡාවට ලක් වන කරුණු සභා වාර්තාවට ඇතුලත් කිරීම අවශ්‍ය නොවන බව ද, ගරු සභාපතිතුමන් දැනුම් දෙන ලදී.

රා තැබෑරුම පවත්වාගෙන යාම සම්බන්ධව කටයුතු කිරීම තමන්ට අයත් කාර්යයක් නොවන අතර, එය ප්‍රාදේශීය ලේකම්වරයා සතු විෂයයක් බව ද, නගර සභාවේ කාර්යය වන්නේ ඒ සඳහා වෙළඳ බලපත්‍රය නිකුත් කිරීම පමණක් බව ද, මත්පැන් පානය කර අශෝභන ලෙස හැසිරෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම පොලිසියට අයත් කාර්යයක් බව ද, එතුමන් සඳහන් කරන ලදී.

ආහාර පනතේ බලධාරියා පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා බැවින් සහ රජය විසින් එළවලු, පළතුරු, මස් සහ මාලු කඩ සභාව විසින් පවත්වාගෙන යා යුතු බවට ගැසට් කර ඇති බැවින් නගර සභාව මගින් ඒවාට ලංසු කැඳවන බව ද, අදාල කඩ වැසීමට ඉහලින් නියෝගයක් පැමිණිය හොත් ඒවා වසා දැමිය හැකි බව ද ගරු සභාපතිතුමන් අවධාරණය කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභාවේ දී ඌරු මස් කඩය සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක් කෙරුණේ න්‍යාය පත්‍රයට බාහිරව වන බැවින්, එය සභාවාර්තාවට ඇතුලත් නොවිය යුත්තක් බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම, එම සභා වාර්තාවේ ඉන්ධන වියදම් දැක්වීමේ දී වෙනසක් වී ඇති බවත්, ගබඩාවෙන් නිසි පරිදි ඒවා ලබා දීම සිදු කළ යුතු බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 2014 වර්ෂය සඳහා මහජන පොල ආපන ශාලාව ගිවිසුම් අත්සන් කිරීම

මහජන පොල ආපන ශාලාවේ ගිවිසුම් කාලය 2013.12.31 වන දිනෙන් අවසන් වන බැවින් 2014 වර්ෂය සඳහා 2013 වර්ෂයේ බදුකරු සමගම නැවත ගිවිසුම් අත්සන් කිරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 11 දරන කඩ කාමරය ලබා ගැනීම - ඊ. ජේ. කේ. පී. පියදාස මයා

බළන්ගොඩ පොදු වෙළඳසැලේ අංක 11 කඩ කාමරය කාලයක සිට වසා දමා ඇති බැවින් මාසිකව රු. 2,000.00ක මුදලට ගබඩා පහසුකම් සඳහා ලබා දෙන මෙන් ඊ. ජේ. කේ. පී. පියදාස යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලද අතර, ගබඩා කාමරයක් ලෙස නොව කඩයක් ලෙස එය යොදා ගත යුතු බැවින් රු. 3,000.00 බැගින් කුලියට වෙනත් අයකු වෙත එය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

### 06:03 නගර සභා ක්‍රීඩා පිටිය වෙන් කර ගැනීම - මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනම

2014.03.28 වන දින සිට 2014.04.01 වන දින දක්වා පැවැත්වීමට සැලසුම්කර ඇති සැනකෙළියක් සඳහා නගර සභා පිටිය වෙන් කර දෙන මෙන් මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනම විසින් මෙම සභාව වෙතින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, රු. 50,000.00ක මුදලක් අය කර ක්‍රීඩා පිටිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:04 මහජන පොල අංක 19 දරන කඩකාමරය ලබා ගැනීම - එල්. ආර්. වික්‍රමරත්න මයා

බළන්ගොඩ මහජන පොල අංක 19 දරන කඩකාමරය ලබා දෙන මෙන් දෘෂ්‍යාබාධිත තැනැත්තකු වන ලක්ෂ්මන් රෝහන වික්‍රමරත්න යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී. අදාල කඩ කාමරයේ හිඟ මුදල ගෙවීමට එම අයට අපහසු වන බැවින්, වෙනත් සුදුසු කඩකාමරයක් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 ඩී - 22 කඩකාමරය නැවත භාර දීම - වී. ජී. එම්. කුලතුංග**

බස් නැවතුම්පොල ඩී - 22 දරන කඩකාමරය නැවත භාර දෙන බව දන්වා වී. ජී. එම්. කුලතුංග යන අය විසින් ලිපියක් එවා ඇති බව ද,එම කඩකාමරය එම්. සුජිත් කුමාර යන අය විසින් ඉල්ලා ඇති බව ද ගරු සභාපතිතුමන් දැනුම් දුන් අතර, වී. ජී. එම්. කුලතුංග යන අයගේ හිඟ කඩ කුලී ඇතිනම් එය තැන්පත් මුදලින් අය කර, කඩ කාමරය භාර ගැනීමටත්, එම කඩ කාමරය එම්. සුජිත් කුමාර යන අයගෙන් මාස 06ක කඩ කුලී ලබාගෙන භාර දීමටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:06 බී - 1 කඩකාමරය පවරා ගැනීම - සිත්තරවේල් තුෂාන්තන්**

බී - 1 කඩ කාමරය අයත්ව සිටි තම පියා මියගොස් ඇති බැවින් එය තමන් වෙත පවරා දෙන මෙන් සිත්තරවේල් තුෂාන්තන් නැමති අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඔහුට ඒ සඳහා නීත්‍යානුකූල අයිතිය ඇති බැවින් අදාල කඩකාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 මහජන පොල අංක 19 දරන කඩකාමරය ලබා ගැනීම - තුරල් ඉන්ද්‍රජිත් මයා**

ඉරිදා පොල අංක 19 දරන කඩකාමරය තමන් වෙත ලබා දෙන මෙන් ඒ. එම්. තුරල් ඉන්ද්‍රජිත් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, සභාවට ලැබිය යුතු සියළුම මුදල් අයකර ඔහු වෙත එය පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 හිඟ කඩ කුලී දැනුම් දීම**

2013.10.31 වන දිනට චන්ද්‍රා සෝබා මුතුමාල යන අය විසින් පවත්වාගෙන යනු ලබන පොදු වෙළඳසැල අංක 14 කඩ කාමරයෙන් රු. 107,742.00ක් ද, පී. ආර්. කමලාවතී යන අය විසින් පවත්වාගෙන යනු ලබන විවෘත කඩ අංක 06 වෙතින් රු. 74,036ක්ද අය වීමට ඇති බව ගරු සභාපතිතුමන් වෙතින් මහා සභාවට දැනුම් දුන් අතර, එම කඩ සීල් තබා, ලංසු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.
එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 ආපදා කළමනාකරණය හා දේශගුණ විපර්යාස අවම කිරීම සම්බන්ධ පළාත් පාලන ආයතනයන්ගේ එකමුතුව - පිලිපීන සංචාරය**

දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධව හොඳම ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික යෙදීම් වලට සම්බන්ධ පළාත් පාලන ආයතනයන්ගේ එකමුතුවේ ආපදා අවදානම අවම කිරීම සහ දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මේලනය 2013 නොවැම්බර් මස 14 වන දින සිට 16 වන දින දක්වා පිලිපීනයේ සෙබු නගරයේ දී පැවැත්වෙන බවත්, ඒ සඳහා සහභාගී වී දේශනයක් සිදු කිරීම සඳහා තමන්ටත්, මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාටත් ආරාධනා ලැබී ඇති බවත්, අදාල ගුවන් ප්‍රවේශ පත්‍ර ගාස්තු මෙම සභාවෙන් දැරිය යුතු අතර, අනෙකුත් සියළු වියදම් යුනෙස්කෝ ආයතනය විසින් දරන බවත්, කොළඹ, සිංගප්පූරුව, මැනිලා හරහා සෙබු වෙත ගුවන් ගමන සිදුවන බවත් ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර,

ඒ සඳහා සහභාගී වීමට තමන්ටත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතාටත් නිවාඩු අනුමත කර ගැනීම සඳහාත්, ගුවන් ගාස්තු වශයෙන් එක් අයෙකුට රු. 87,500.00 බැගින් දෙදෙනාටම රු. 175,000.00 මුදලක් සභා අරමුදලින් දැරීමටත්, මහා සභාවේ අනුමැතිය ලබා දීමට එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 ගිනි නිවන රථය හා ජල බවුසරය අළුත්නුවර පෙරහැර රාජකාරි සඳහා යෙදවීම**

බලන්ගොඩ අලුත්නුවර දේවාලයේ පෙරහැර රාජකාරි සඳහා යොදවන ලද අමල් තුෂාර, අමිල ප්‍රසාද්, කෝසල අංජු, ඒ. එන්. ජයසිංහ, සමන්ත විජේසිංහ, ජී. එච්. විජිත, යූ. ආර්. පියදාස, එන්. ඒ. සරත් කුමාර යන සේවකයන් විසින් සේවය කර ඇති පැය ගණන් වලට අදාලව අතිකාල මුදල් ගෙවීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව ස්ථිර විය.

**06:11 කඩ කුලී අඩු කර ගැනීම - බී. ගුණරත්න මයා**

බලන්ගොඩ, රාස්සගල පාර, අංක 63/3 ස්ථානයේ පදිංචි බී. ගුණරත්න යන අය විසින් ලංසු පදනම මත මහජන පොලේ පවත්වාගෙන යන ආපන ශාලාවේ කඩකුලී අඩු කර දෙන ලෙස ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම ඉල්ලීම අනුව අදාල කඩකුලී අඩු කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් විමසීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිව සම්මත විය.

**06:12 කෲ කැබ් රථය අළුත්වැඩියා කිරීම**

56-1906 දරන මෙම සභාවේ කෲ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවන ලදුව ලැබුණු මිල ගණන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ, ලක්මිණි මෝටර්ස් වෙතින් එම සේවාව ඉටු කර ගැනීමට යෝජනා කරන ලදී.

| ආයතනය | මිල ගණන් |
|---|---|
| ලක්මිණි මෝටර්ස් | රු. 28,500.00 |
| නැෂනල් මෝටර්ස් | රු. 32,000.00 |
| නිෂානි මෝටර්ස් | රු. 30,100.00 |
| තරංගා මෝටර්ස් | රු. 32,100.00 |

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 ක්‍රීඩා කටයුතු සඳහා මහා සභා තීරණය ලබා ගැනීම**

බළන්ගොඩ නගර සභාවේ සේවයේ නියුතු ක්‍රීඩා කෞෂල්‍යයෙන් යුතු නිලධාරී මහත්ම මහත්මීන්ගේ සහ සේවක සේවිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවයන් නංවාලමින් අන්තර් රාජ්‍ය සේවක ක්‍රීඩා තරගාවලීන් සඳහා ඉදිරිපත් කරවීම සඳහා පහත කරුණු මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

1. 'බළන්ගොඩ නගර සභා ක්‍රීඩා සමාජය' නමින් ක්‍රීඩා සමාජයක් පිහිටුවීම

    - අනුශාසක කමිටුව
        - ගරු සභාපතිතුමා
        - ගරු උප සභාපතිතුමා ඇතුළු නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා
    - පරිපාලන කමිටුව
        - ලේකම් - එම්. එච්. සීලවතී මිය
        - ගණකාධිකාරී - එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
        - මහජන සෞඛ්‍ය පරීක්ෂක - එම්. ඒ. එන්. ප්‍රේමතිලක මයා
        - වැඩ අධිකාරී - යූ. වී. දැල බණ්ඩාර මයා
        - ආදායම් පරීක්ෂක - එස්. එම්. එස්. ආනන්ද මයා
        - ප්‍රධාන කළමනාකරණ සහකාර - එස්. එච්. අමිතා කරුණාරත්න මිය
        - පුස්තකාලයාධිපති - එස්. පී. වික්‍රමරත්න මෙය
        - ප්‍රධාන පෙරපාසැල් පාලිකා - ශ්‍රියාණි හෙට්ටිආරච්චි මිය
    - මුදල් කමිටුව
        - රජිත කොස්වත්ත මයා - සංවර්ධන නිලධාරී
        - පී. වී ලලිත් සමරජීව මයා - සංවර්ධන නිලධාරී
        - සංජී වසන්ති මිය - සංවර්ධන නිලධාරී
        - මධුෂානී ආනන්ද මිය - සංවර්ධන නිලධාරී
        - හැරල්ඩ් විජිත මයා - වැඩ පරිපාලක
    - ක්‍රියාකාරී කමිටුව
        - අරුණකාන්ති සේමපාල මිය - කළමනාකරණ සහකාර
        - කුමාර කරුණාරත්න මයා - කාර්මික නිලධාරී
        - කුමාර සෙනෙවිරත්න මයා - කළමනාකරණ සහකාර
        - ඩියුක් ඩැනියෙල් මයා - බළන්ගොඩ තානායම
        - ලහිරු ශ්‍යාමල් මයා - බළන්ගොඩ තානායම
        - අමිල මිහිරංග මයා - සංවර්ධන නිලධාරී
        - එම්. සෙල්වරාණි මිය - කළමනාකරණ සහකාර
        - ඉරෝෂා සෙව්වන්දි මිය - කළමනාකරණ සහකාර
        - රසිකා මීගස්දෙනිය මිය - සංවර්ධන නිලධාරී
        - රේණුකා දමයන්ති මිය - කාර්යාල කාර්ය සහායක
        - අමිල ප්‍රසාද් මයා - කාර්යාල කාර්ය සහායක
        - ඩබ්. ඒ. සේනක මයා - රියදුරු
        - අමල් තුෂාර මයා - රියදුරු
        - සරත් ආනන්ද මයා - රියදුරු
        - කේ. ඩී. කීර්තිපාල මයා - මාර්ග කම්කරු

2. ක්‍රීඩා කටයුතු සඳහා 'බළන්ගොඩ නගර සභා ක්‍රීඩා සමාජය' නමින් අරමුදලක් පිහිටුවීම - බළන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා කටයුතු සඳහා වෙනම ගිණුමක්රජයේ බැංකුවක ආරම්භ කර, ක්‍රීඩා කටයුතු කරගෙන යාම සඳහා එම අරමුදලින් මුදල් වෙන් කරගැනීම මූලික අරමුණ වේ. මෙම ගිණුමට අදාල චෙක්පත් අත්සන් කිරීම් බලය බළන්ගොඩ නගර සභාවේ පොදු ගිණුමේ චෙක්පත් අත්සන් කිරීමේ බලතල හා සමාන වේ.

3. නගර සභාවේ ක්‍රීඩා සමාජයේ උන්නතිය සඳහා බලන්ගොඩ ප්‍රදේශයේ කැපී පෙනෙන ක්‍රීඩා දක්ෂතාවයන්ගෙන් යුතු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔවුන්ගේ ක්‍රීඩා සුදුසුකම් මත දැනට ආයතනයේ පවතින පුරප්පාඩු පදනම් කරගෙන බඳවා ගැනීම.
4. ක්‍රීඩා තරගාවලි සඳහා ඉදිරිපත්වීමට අපේක්ෂිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පෙර පුහුණුවීම් කටයුතු වෙනුවෙන් දිනපතා රාජකාරී වේලාවෙන් ප.ව. 3.00 සිට නිදහස් කිරීම.
5. කාර්යාල පරිශ්‍රයෙහි හෝ කාර්යාලයීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පහසු ස්ථානයක අත්පන්දු හා දැල්පන්දු පිටි සකස් කිරීම.

ඉහත යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 ස්තුතිය පළ කිරීම - උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය**

උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ 2013 ඇසළ පෙරහැර මංගල්‍යය සාර්ථකව සිදු කළ බවත්, ඒ සඳහා දායකත්වය ලබා දීමට සහ දේවාලයේ දියුණුව පිණිස කටයුතු කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමන්ට ස්තුතිය පළ කරමින් එහි බස්නායක නිලමේ මිගාර ජයසුන්දර මහතා විසින් එවා තිබූ ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

**06:15 2013 මග නැගුම ගැටලු සාකච්ඡා කිරීම**

මග නැගුම වැඩසටහන යටතේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා හට වෙන් වී ඇති රු. 1,000,000.00 ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක වන, ඇල්ලෙඅරාව නාමල් උයන මාර්ගය සහ ඇල්ලෙඅරාව බෝධියට යන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් මේ දක්වා ආරම්භ කිරීම සිදු නොවී ඇති බැවින්, එම කර්මාන්ත නොපමාව ආරම්භ කරන මෙන් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුම් දෙන ලදී

**06:16 2013.10.21 වන දින ඉන්ධන ලීටර 15ක් (56-1906) අඩුවීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂණය**

2013.10.21 වන දින ඉන්ධන ලීටර 15ක් (56-1906) අඩුවීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂණයේ වාර්තාව මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව පහත පරිදිය.

I. සමන්ත විජේසිංහ ය නඅය ඉන්ධන ලීටර් 45ක් ලබා ගැනීමෙන් අනතුරුව තෙබුවන ගරාජයට, ඉන්පසු කාර්යාලයට, ලක්මිණි ගරාජයට, ඉන්පසු ඇල්ලෙපොල පියසිරි බාස් සමඟ ඇල්ලෙපොලට, නැවත කාර්යාලයට සහ නැවත ඇල්ලෙපොලට හා නැවත් කාර්යාලයට පැමිණ ඇත.
ඉහත ගමන් වාර ගැන සැලකීමේ දී ඩීසල් ලීටර් 15ක් දහනය වී මපිළිබඳ ගැටලුවක් නොමැති බව පෙනී යයි.

II. මුරකරුගේ ප්‍රකාශය අනුව රියදුරන් විසින් ඇතැම් අවස්ථා වල දී මීටරයේ අගය ලබා නොදෙන බව නිරීක්ෂණය විය.
ගරු උප සභාපතිමා විමසූ අවස්ථාවේ දී ඉන්ධන ලබා ගැනීමෙන් පසු ගමන් කළ වාර පිළිබඳව පැහැදිලි විස්තරයක් ගරු උප සභාපතිතුමා වෙත සමන්ත විජේසිංහ යන අය විසින් ලබා නොදීම මත මෙම ගැටළුකාරී තත්ත්වය උද්ගත වී ඇති බව පෙනී යයි.

**06:17 පොදුවෙළඳ සැල උඅරු මස් කඩයකට විරෝධය දැක්වීම**

බළන්ගොඩ නගර සභාවෙන් පොදු වෙළඳසැලේ ඌරු මස් කඩයක් විවෘත කිරීමට විරෝධය දක්වමින් පොදුවෙළඳ සංගමයේ ව්‍යාපාරිකයන්ගේ අත්සනින් යුතුව එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

මෙසේ විරෝධයක් පවතින බැවින් සියළු දෙනාගේම අදහස් සැලකිල්ලට ගෙන බර්නාඩ් යන අය විසින් පවත්වාගෙන ගිය පැරණි කඩකාමරය මේ සඳහා සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එමෙන්ම මෙම විරෝධතාවය හේතුවෙන් අනෙකුත් මස් කඩ ලංසු කැඳවීම ද නොවැම්බර් මාසයේ දී සිදු කිරීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 ජාතික පුස්තකාල ප්‍රලේඛන මණ්ඩලය විසින් පවත්වන ලද තරග වල දී සම්මාන ලබා ගැනීම**

2013.10.29 වන දින, කොළඹ 07, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2013 ඔක්තෝබර් ජාතික කියවීම් මාසයේ ජාතික උත්සවයේ දී පහත සඳහන් සම්මාන බළන්ගොඩ මහජන පුස්තකාලය වෙත ලැබුණු බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

I. 2011 හොඳම මහජන පුස්තකාලය තේරීමේ තරගයේ නගර සභා මහජන පුස්තකාල අතරින්, තෙවන ස්ථානය

II. 2012 ජාතික කියවීම් මාසයේ වැඩසටහන් ඉටු කිරීම වෙනුවෙන් සම්මාන

III. විශිෂ්ට ලෙස සංරක්ෂණ කටයුතු සිදුකරන ලද මහජන පුස්තකාල තේරීමේ තරගයේ 2011 කුසලතා සහතික.

ඉහත සම්මාන ලබා ගැනීම සම්බන්ධයෙන් පුස්තකාලයීය කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු වලට ප්‍රශංසා සහතික ඇතුළත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 අතිගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ අටවන සැමරුම**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ පදවි ප්‍රාප්තියේ අටවන සැමරුම වෙනුවෙන්, බැනර් දෙකක් ප්‍රදර්ශනය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික සම්මත විය.

**06:20 පෙර පාසැල් ලියාපදිංචි කිරීම හා ගාස්තු අය කිරීම**

පෙර පාසැල් වලින් මේ දක්වා ලියාපදිංචි කිරීමේ ගාස්තු අයකර ඇත්තේ පෞද්ගලික උපකාරක පන්ති යටතේ බව සඳහන් කළ ගරු සභාපතිතුමන්, ළදරු පාසැල් වලින් බලපත්‍ර ගාස්තු අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය,

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 බෙතල්හිල් මාර්ගයේ ඉහල කොටසෙහි පස් කැපීම හා ප්‍රවාහනය කිරීම කර්මාන්තය

බෙතල්හිල් මාර්ගයේ ඉහල කොටසෙහි පස් කැපීම හා ප්‍රවාහනය කිරීම කර්මාන්තයේ රු. 35,510.97ක වියදම් ඇස්තමේනතුව සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

#### 11:01:01 2014 වර්ෂය - කසළ ඉවත් කිරීම පිළිබඳ තීරණය

මෙම සභාවේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය සම්බන්ධව නගර සභාවේ දෛනික පිරිසිදු කිරීම් හා කසළ එකතු කිරීම් සඳහා ප්‍රමාණවත් පරිදි වාහන තිබුණත් අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු හේතුවෙන් හා එම පුරප්පාඩු පුරවන තෙක්, දෛනික පිරිසිදු කිරීම් සඳහා කම්කරු ශ්‍රමය සහ අවශ්‍ය ද්‍රව්‍ය පෞද්ගලික ලංසුකරුවකු මගින් සපයා ගැනීම, ලංසු කැඳවීම, වාර්ෂිකව උපරිම ලංසුව රු. 2,820,000.00ක් (විසිඅටලක්ෂ විසි දහස) වන සේ ලංසු කැඳවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

#### 11:01:02 පොදු වැසිකිළි නඩත්තුව සහ ගාස්තු අය කිරීමේ ටෙන්ඩර් කිරීම

ප්‍රමාණවත් අනුමත සේවක සංඛ්‍යාවක් පිරිසිදු කිරීම් කටයුතු සඳහා නොමැති බැවින් බස් නැවතුම්පොල ගැහැණු සහ පිරිමි පොදු වැසිකිළි හා මහජන පොල වැසිකිළි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම පෞද්ගලික අංශයට පැවරීම සඳහා ලංසු කැඳවීමට, පූජ්‍ය පක්ෂය සහ පාසැල් ළමුන් හැර එක් අයකුගෙන් රු. 10.00ක ගාස්තුවක් අය කර, අවමය රු. 650,000.00කට වන සේ ලංසු කැඳවීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:03 බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට Conveyer Belt එකක් සැදීම**

බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට Conveyer Belt එකක් සැදීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:04 දැනට ඇති ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කොට එය අසළ පිහිටි වැඩ අංශය සතු කාමර සහිත ස්ථානයේ කොන්ක්‍රීට් යොදා අළුතින් සකස් කිරීම**

දැනට ඇති ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කොට එය අසළ පිහිටි වැඩ අංශය සතු කාමර සහිත ස්ථානයේ කොන්ක්‍රීට් යොදා අළුතින් සකස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:05 දැනට ගබඩාව පවතින කොටස හා එම ස්ථානයේ වාහන නවත්වන ගරාජය රැස්වීම් ශාලාවක් ලෙස සකස් කිරීම**

දැනට ගබඩාව පවතින කොටස හා එම ස්ථානයේ වාහන නවත්වන ගරාජය රැස්වීම් ශාලාවක් ලෙස සකස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:06 ඇල්ලෙපොල දෙවන 3R සමාජයේ ඉල්ලීම අනුව වීථි ලාම්පුවක් සවි කිරීම - සෙනෙවිරත්න මහතාගේ නිවසට යන මාර්ගය අසළ**

ඇල්ලෙපොල දෙවන 3R සමාජයේ ඉල්ලීම අනුව සෙනෙවිරත්න මහතාගේ නිවසට යන මාර්ගය අසළවීථි ලාම්පුවක් සවි කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:07 නගර සභා ආඥා පනත අනුව සභාව සතු බලතල එහි ප්‍රධාන විධායක නිලධාරියා වන ගරු සභාපතිතුමන් වෙත පැවරීම**

නගර සභා ආඥා පනත අනුව සභාව සතු බලතල එහි ප්‍රධාන විධායක නිලධාරියා වන ගරු සභාපතිතුමන් වෙත පැවරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එසේ බලතල පැවරීම සම්බන්ධව ගරු උප සභාපතිතුමන් සහ ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර හා චමික ජයමිණ වැවේගෙදර යන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

***ගරු උප සභාපතිතුමන් මේ සම්බන්ධව අදහස් දක්වමින්:***

*අප මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්. මා විමසනවා ඔබතුමන් ඒ බලතල ඉල්ලන්නේ නගර සභා ආඥා පනතේ කවර වගන්තියකට අනුවද කියා. අප මහජන නියෝජිතයන් වශයෙන් ඔබතුමන් මෙහි සිදු කරන ඕනෑම දෙයකට සහයෝගය ලබා දී තිබෙනවා. ඒ නිසා අමුතුවෙන් බලතල පවරා ගැනීමක් කිරීම අවශ්‍ය වන්නේ නෑ. අපගේ බලතල ඔබතුමන් විසින් ලබා ගන්නවා නම් මා එය දැඩි ලෙස පිළිකුල් සහගතව එම යෝජනාව ප්‍රතික්ෂේප කරනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින්:***

*ඔබතුමන් ඉල්ලන බලය සම්බන්ධව අපගේ දැනුවත් බවක් නෑ. ඔබතුමන් ඉල්ලන්නේ කවරාකාරයේ බලයක් ද යන්න ගැන ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කළ යුතුයි. මා ද මෙම සභාවේ වසර ගණනාවක් මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළා. එම කාලය තුළ ඔබතුමා බලය උපරිම අයුරින් පාවිච්චි කළා. මා සිතන්නේ නෑ ඔබතුමන්ගේ බලය යන්තමින් හෝ අඩු වුනා කියලා. කැබිනට් ඇමතිවරයකුට වඩා බලයක් ඔබතුමන්ට තිබෙනවා. ඔබතුමා අවශ්‍ය දේ කරනවා. හිතෙන දේ කරනවා. ඔබතුමන්ට කරන්නට බැරි දෙයක් නෑ. අප ඔබතුමා සිදු කරන කිසිදු දෙයකට විරුද්ධ වී නෑ.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා අදහස් දක්වමින්:***

*නගර සභා බලතල වශයෙන් ඉල්ලන්නේ කුමක් දැයි දැන ගැනීමට කැමතියි. මා එම යෝජනාවට හෘදය සාක්ෂියට එකඟව මගේ විරෝධතාවය දක්වනවා.*

***මේ සම්බන්ධව ගරු සභාපතිතුමන් පිළිතුරු දෙමින්:***

*මෙම යෝජනාවන් මා විසින් විදේශගතව සිටිය දී විද්‍යුත් තැපැල මගින් එව්වේ. මෙතනදි මම ඉල්ලීම කළේ නගර සභා ආඥා පනත අනුව සභාව සතු බලතල ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් පවරා දීමට යොජනාවක් අවශ්‍යයි. අප කාර්ය සාධන තරගවලට ඉදිරිපත් වීමේ දී, අදාල නිර්ණායකයන්හි එසේ කළ යුතු බව තිබෙනවා. මේ තීන්දුව සභාවේ අරන් නොමැති නිසා අපට ලකුණු ලැබුණේ නෑ. 7(3) වගන්තිය කියවන්න. මෙහි අමුතු බලයක් අවශ්‍ය නෑ. බලය තිබෙනවා. නමුත්, ඒ බලය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය අවශ්‍යයි. උදාහරණයක් වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට, ආදායම් පරීක්ෂකවරයාට සහ වැඩ අධිකාරීවරයාට අදාල නඩු සඳහා උසාවි යාමට සභාවෙන් පත් කර තිබෙනවා. ජනාධිපතිවරයා නගරයට ගොඩබැසීමට වුවත් සභාපතිවරයාගෙන් අවසර ගත යුතුයි.*

*මෙය වරදවා තේරුම් නොගත යුතුයි. මෙහි දී අවශ්‍ය වන්නේ කාර්ය සාධන නිර්ණායක අනුව ක්‍රියා කිරීමයි. අදාල සභා තීරණය තිබෙනවා නම් එයට 100%ක් ලකුණු ලැබෙනවා. මෙවර කාර්ය සාධන තරගය විනිශ්චයට පැමිණි අවස්ථාවේ මා විදේශගතව සිටියේ. මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා මා හට ප්‍රකාශ කළේ, මෙම අදාල ලකුණු ලබා ගැනීමට මෙම සභා තීරණය ගත යුතු බව. එවිට මා එය යෝජනාවක් වශයෙන් විද්‍යුත් තැපැල ඔස්සේ එවනු ලැබුවේ.*

වැඩිදුර තොරතුරු විමසූ බැවින්, ඒ පිළිබඳව ලබන මහා සභා වාරයේ දී කරුණු ඉදිරිපත් කිරීමට තීරණය විය.

**11:01:08 බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ආපදා අවම කිරීමේ හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටීම**

UN Habitat සහයෝගය මත නාගරික සංවර්ධන අධිකාරියේ හා මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස් කර ඇති බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ආපදා

අවම කිරීමේ හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11:01:09 **ආපදා කළමනාකරණ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා එම අංශය භාර Chief Resilient Officer වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත පැවරීම**

ආපදා කළමනාකරණ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා එම අංශය භාර Chief Resilient Officer කෙනෙක් පත් කිරීම සුදුසු බවට UN Habitat ආයතනය යෝජනා කර ඇති අතර, ඒ සඳහා සුදුසු අයෙකු පත් කරන තෙක් එහි රාජකාරි කටයුතු ආවරණය කිරීම මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත පැවරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:10 නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් දැනට වෙන් කර ඇති ඉඩමේ පොදු පරිපාලන ගොඩනැගිල්ලක් හා නගර ශාලාවක් ඉදි කිරීම**

නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් දැනට වෙන් කර ඇති ඉඩමේ පොදු පරිපාලන ගොඩනැගිල්ලක් හා නගර ශාලාවක් ඉදි කිරීමේ යෝජනාව 2014 ජාතික අය වැය යෝජනාව සඳහා ඉදිරිපත් කිරීම පිණිස දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ඉදිරිපත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:11 2014 වර්ෂයේ දැනට ලබා දී ඇති වෝකි-ටෝකි තරංග මාලාව උපයෝගී කරගෙන සියළුම ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සඳහා වෝකි ටෝකි යන්ත්‍ර ලබා දී**

2014 වර්ෂයේ දැනට ලබා දී ඇති වෝකි-ටෝකි තරංග මාලාව උපයෝගී කරගෙන සියළුම ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සඳහා වෝකි ටෝකි යන්ත්‍ර ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයේ එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11:01:12 **නගර සභා ලාංඡනය වෙනස් කිරීම**

මෙම නගර සභා ලාංඡනයේ ජනතාවගේ පූජනීයත්වයට පත් ශ්‍රී පාදස්ථානය වැනි ලකුණු ඇති බවත්, එය තානායමේ පිඟන් කෝප්ප වල පවා දැක්වීම සිදුවන අතර, එය නුසුදුසු බැවින්, එම ලාංඡනය බලන්ගොඩ මානවයාගේ රුව යොදා වෙනස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් දක්වන ලදී.

***ගරු උප සභාපතිතුමා:***

*මීට වසර දෙකකට පමණ ඉහත දී මා ප්‍රකාශ කළා නගර සභා ලාංඡනය තානායමේ බඳුන් වල මුද්‍රණය කරන්න එපා කියලා. එසේ කිරීමේ විපාකය මා දකිනවා. එවකට මෙම ලාංඡනය සැලසුම් කළ පුද්ගලයන් ශ්‍රී*

*පාදස්ථානයේ සලකුණ ලාංඡනයට ඇතුළත් කළේ හේතු ඇතිවයි. එම නිසා එම ලාංඡනය වැරදි තැන්වල නොතබා උත්තරීතර ස්ථානයන්හි තැබිය යුතුයි. එබැවින් ලාංඡනය වෙනස් කළ යුතු නෑ. සබරගමුව විශ්ව විද්‍යාලයේ ද, රත්නපුර මහා නගර සභාවේ ද, ආනන්ද මෛත්‍රෙය ජාතික පාසැලේ ද මෙම ලාංඡනය තිබෙනවා. ශ්‍රී පාද කන්ද සබරගමුවට අභිමානයක්. එය බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී පාද සලකුණ තැබූ ස්ථානයක්. එය ලාංඡනයක් ලෙස හෝ තිබීම උත්තරීතරයි.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*ශ්‍රී පාදස්ථානය කියන්නෙ බෞද්ධයන්ගේ මුදුන් මල් කඩක්. අපගේ සබරගමුව පළාතේ බළන්ගොඩට ඉතාමත් ආසන්නයෙන් එය පිහිටා තිබෙන්නේ. අපගේ නගරය හරහා ගලන වළවේ ගංගාවත් ආරම්භ වන්නේ ශ්‍රී පාද කන්දෙන්. අපගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන මැණික් සම්පත ලැබෙන්නෙත් සමන් දෙවියන්ගේ පිහිටෙන්. එමෙන්ම අලියා අපගේ ජාතික සම්පතක්. මෙම ලාංඡනය වෙනස් නොකරන්න යැයි මා ඉල්ලා සිටිනවා. නගර සභාව කියන්නෙ බළන්ගොඩ තිබෙන උත්තරීතරම ස්ථානයක්. එබැවින් එහි ලාංඡනය ගෞරවනීය තැන් වල තබන්න. තානායමේ පිඟන් කෝප්ප වල මස් මාංස පවා තබනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*ඔබතුමන් ඇතුළු අපි සියළු දෙනා ඉපදීමටත් කලකට පෙර උගත්, නැණවත් සහ බුද්ධිමත්. අද වගේ නෙවෙයි. අද 99%ක්ම රටට ජාතියට ආගමට ලැදිව, කටයුතු කරන දේශපාලකයින් නෑ. හැම කෙනෙක්ම බලන්නෙ තමන්ගේ දේවල් වර්ධනය කරගෙන, තමන්ගේ පවුල් නඩත්තු කරගෙන ගමනක් යන්න. එයා හිටපු දේශපාලකයො මීට වඩා බොහෝ දුරදිග කල්පනා කරලා, රටට, ජාතියට, රටේ ජීවත් වන විවිධ ජාතීන්ගේ ජනතාවට ආදරයෙන් ලෙංගතුකමෙන් ගත්ත තීරණ තියෙන්නෙ.*

*ගරු උප සභාපතිතුමන් සහ මන්ත්‍රීතුමන් ප්‍රකාශ කළ පරිදි මෙතන ගැටලුව බවට පත් වී ඇත්තේ එය නුසුදුසු තැනක පිහිටවූ එකයි. තානායම කියන්නෙ අපට අලුතින් එකතු වූ අංගයක්. ඒ නිසා මම ඉල්ලා සිටිනවා එම පිඟන් කෝප්ප විනාශ කරනවා නම් එය කිරීමට හෝ එම ලාංඡනය මකා දැමීමට සහ තානායමට සුදුසු ලාංඡනයක් දැමීමට. අප සම්පූර්ණයෙන් විරුද්ධයි නගර සභාවේ ලාංඡනය වෙනස් කිරීමට.*

*A4 මාර්ගය සඳහා මොහාන් එල්ලාවල මාවත යොදා ගැනීම ඉතාමත් හොඳ තීරණයක්. එමෙන්ම දැනට පවතින වීථි රේඛා සීමාව වැඩි නොවී එම කටයුතු සිදුකිරීම සුදුසුයි. එහි මාගේ සහ තවත් අයගේ ව්‍යාපාරයන් පවතිනවා. නගරයක්, රටක්, ගමක් සංවර්ධනය වන විට දේශීය ආදායමට දායක වන ව්‍යාපාරිකයන්ට හිරිහැරයක් නොවී එම සංවර්ධන කටයුතු සිදු කළ යුතුයි. මොහාන් සාලිය එල්ලාවල මාර්ගය A4 මාර්ගය වශයෙන් ඉල්ලනවා නම්, ඔරලෝසු කණුව අසළ ඇති වට ප්‍රමාණය අඩු කළ හැකි නම් සුදුසුයි.*

***ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව පිළිතුරු දෙමින්:***

*පිඟන් කෝප්ප වල ලාංඡනය තැබීම සභාවේ සියළු දෙනාගේ අදහස් ලබාගෙන සිදු කළේ. ඒ අවස්ථාවේ මෙය කිසිවකුගේ මතකයට ආවේ නෑ. මා අදහස් කරන්නේ අප මුදල් වියදම් කර මුද්‍රණය කළ පිඟන් කෝප්ප*

*තිබෙනවා. එය ඉවත් කිරීමට මහා සභාවේ අනුමැතිය අවශ්‍යයි. මා මේ යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ එයයි. තානායම නගර සභාවට අලුතින් එකතු වූ අංගයක් නොවෙයි. එය කලක් නගර සභාව යටතේ තිබී පසුව නාගරික සංවර්ධන අධිකාරියෙන් පාලනය වී නැවත නගර සභාවට පවරා ගන්නා ලද්දක්.*

*ඔරලෝසු කණුව වටරවුම සෑදුවේ විශාල ප්‍රමාණයේ වාහන හරවා බැලීමෙන් අනතුරුවයි. ඒ නිසා ඕනෑම වාහනයකට හැරවීමට හැකි පරිදි එය තිබෙන බව කිව යුතුයි.*

*නගර සභා ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමන්ගේ ප්‍රකාශයට පිළිතුරු දිය යුතුයි. සියළුම දේශපාලඥයන් සහ ප්‍රභූ ජනතාව රටට, ජාතියට ආදරේ පුද්ගලයන්. වැරදි කරන ඇතැම් පුද්ගලයන් ද ඇති. එබැවින් එය ඔබතුමාගේ ප්‍රකාශයෙන් ඉල්ලා අස්කර ගන්නා ලෙස ඉල්ලනවා. රටක ආගමට ජාතියට ආදරෙයි සියලුම දෙනා. හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා රටට වැඩක් කළ, පළාත් පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ නායකයෙක්. එතුමා මිය ගිය දවසේ පාරෙ කැවුම්, කිරිබත් ඉව්වා. එදා ජනතා විමුක්ති පෙරමුණ මර්ධනය කළ නිසා ඔහුට වෙනම නමක් තැබුවා. එදා හිටපු පාලකයන්ට මිනී මැරුවා කියලා අත දික් කළා. ඒ සියළු දෙනා යම් කිසි සේවයක්, සංවර්ධනයක් රටට සිදු කරපු අය. ඒ ඒ අයගෙන් යම් කිසි දේවල් සිදු විය හැකියි. එබැවින් මා නැවත ඔබතුමන්ගෙන් ඉල්ලා සිටින්නේ ඒ අය රටට ජාතියට ලැදි අය නොවෙයි යනුවෙන් කළ ප්‍රකාශය ඉල්ලා අස්කරගන්නා ලෙසයි.*

*අද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු 30ක් තිස්සේ තිබූ යුද්ධය නිමා කරලා, සියළුම ජාතීන් එකතු කරලා රට පාලනය කරනවා. නමුත් එතුමාටත් විරුද්ධවාදීන් සිටිනවා. අවුරුදු 30ක යුද්ධය නිම කළත් යාපනයෙන් මෙවර මැතිවරණයේ දී අපට ඡන්ද ලැබුණේ නෑ. කුරිරු, මිනීමරු එල් ටී ටී ඊ සංවිධානයටයි ඡන්දය දුන්නේ. ඒක ඒ මිනිසුන්ගේ හැටි. උතුරු වසන්තය, නැගෙනහිර වසන්තය වැනි ව්‍යාපෘති තුළ ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා උතුර සංවර්ධනය කරලා තිබෙනවා. එතුමන්ලා දේශපාලනය කරන්න ගියේ නෑ. අවුරුදු 30ක් ප්‍රජා අයිතිය නැතිවෙලා මැතිවරණ නොතියපු උතුරේ මැතිවරණයක් තිබ්බා. අපිත් බලාපොරොත්තු වනවා උතුරු පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමත් එක්ක එකතු වෙලා පළාත් පාලන ආයතන වල අයිතිය ලබා ගැනීමට සටන් කරන්න. අපිට නොලැබෙන දේවල් තිබෙනවා. එයින් එකක් සුළු සේවකයන් බඳවා ගැනීමේ අයිතිය සබරගමුව පළාතේ පමණක් සභා ලේකම්වරුන්ට ලබා දී නෑ. අනෙක් සියළු පළාත් වල තිබෙනවා. මේ හේතුවෙන් කම්කරුවන්, රියදුරන් හා කාර්යාල කාර්ය සහායකයන් බඳවා ගැනීමට නොහැකි වී තිබෙනවා. 2002 වර්ෂයේ අපගේ ආණ්ඩුව පෙරළුණු අවස්ථාවේ රනිල් වික්‍රමසිංහ මහතා 16/1 චක්‍රලේඛය නිකුත් කරලා, රාජ්‍ය සේවය අහෝසි කළා. ඒ අහෝසි කිරීම තුළ අද අපටත් බඳවා ගන්න බෑ. ගරු මන්ත්‍රීතුමා නායකයෝ වැඩ කළ අයත් සිටිනවා, වැඩ නොකළ අයත් සිටිනවා.*

එම අදහස් සැලකිල්ලට ගනිමින් නගර සභා ලාංඡනය වෙනස් කිරීම වෙනුවට එම ලාංඡනය සහිත පිඟන් හා කෝප්ප තානායමෙන් ඉවත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:13 තානායමට හට් එකක් ලබා ගැනීම**

බළන්ගොඩ තානායම සඳහා හට් එකක් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:14 A4 මාර්ගය සඳහා නගර මධ්‍යයෙන් ඇති මාර්ගය වෙනුවට නව අතුරු වන මොහාන් එල්ලාවල මාර්ගය යොදා ගැනීම**

A4 මාර්ගය සඳහා නගර මධ්‍යයෙන් ඇති මාර්ගය වෙනුවට නව අතුරු වන මොහාන් එල්ලාවල මාර්ගය යොදා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට යෝජනා කිරීම ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:15 පෞද්ගලික විදේශ සංචාරයක් සඳහා 2013.11.01 වන දින සිට මාසයක කාලයක් සඳහා නිවාඩු අනුමත කර ගැනීම**

පෞද්ගලික විදේශ සංචාරයක් සඳහා 2013.11.01 වන දින සිට මාසයක කාලයක් සඳහා නිවාඩු අනුමත කර ගැනීම සඳහා න්‍යාය පත්‍රයට යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කළ ද, රාජකාරීමය කටයුතු යෙදී තිබෙන බැවින් එම විදේශ සංචාරය සිදු නොකරන බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.

**11:01:16 පසුගිය සභාවාරයේ ගරු සභාපතිතුමාගේ තීරණයක් අනුව අලුතින් රියදුරු 01, මුරකරු 01 ක් හා කාර්යාල කාර්ය සහායක දෙදෙනෙක් බඳවා ගැනීම අනුමත කර ගැනීම**

පසුගිය සභාවාරයේ ගරු සභාපතිතුමාගේ තීරණයක් අනුව අලුතින් රියදුරු 01, මුරකරු 01 ක් හා කාර්යාල කාර්ය සහායක දෙදෙනෙක් බඳවා ගැනීම අනුමත කර ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:17 2014 වර්ෂය සඳහා බලන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල මස්කඩ, මාළු කඩ අංක 14, විවෘත කඩ අංක 06, බලන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු, අය කිරීම හා නඩත්තු කිරීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ලංසුපත් කැඳවීම**

2014 වර්ෂය සඳහා බලන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල මස්කඩ, මාළු කඩ අංක 14, විවෘත කඩ අංක 06, බලන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු, අය කිරීම හා නඩත්තු කිරීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ලංසුපත් කැඳවීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. අදාල දැන්වීම පහත පරිදිය.

2014 ජනවාරි මස පළමු වන දින සිට 2014 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වු ලිත් වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන අයිතමයන් වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසුපත් බලන්ගොඩ නගර සභාවේ සභාපති වන මා විසින් 2013 නොවැම්බර් 26 වන දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

**ලංසුපත් නිකුත් කිරීම:**

2013 නොවැම්බර් 25 වන දින ප.ව. 3.00 දක්වා බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ වැඩි විස්තර කාර්යාලිය දුරකථන අංක 045-2287275 ඇමතිමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකය.

**ලංසුපත් විවෘත කිරිම:**

2013 ඔක්තෝබර් මස 26 වන දින පෙ.ව. 10.30 ට විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

**විශේෂ කොන්දෙසි:**

රජයේ අනුමත කර ඇති බලපත් සහිත ඕනෑම ගෝ ඝාතකාගාරයකින් මස් සපයා ගත හැක.

එක් එක් ටෙන්ඩරය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ ටෙන්ඩරයේ නම සඳහන් විය යුතුය.

**උප ලේඛනය**

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුපත් ගාස්තු | | | | අවම වාර්ෂික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | ජා.ගො.බ | එකතුව | |
| 01 | පොදු වෙළඳ සැල අංක 14 දරන මාළු කඩය | රු. 3,000.00 | රු .1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 75600.00 |
| 02 | පොදු වෙළඳ සැල අංක 15 දරන එළු මස් කඩය | රු. 3,000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 75600.00 |
| 03 | පොදු වෙළඳ සැල අංක 16 දරන එළ හරක් මස් කඩය | රු. 10000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 1500600.00 |
| 04 | පොදු වෙළඳ සැල අංක 17 දරන කුකුල් මස් කඩය | රු. 5000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 320592.00 |
| 05 | විවෘත කඩ (කාර් පාක්) අංක 06 කඩ කාමරය | රු. 3000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 117000.00 |
| 06 | බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම | රු. 3000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 1050000.00 |
| 07 | 2014 වර්ෂය තුළ අනුමත වැඩසැලැස්ම අනුව නගරයේ විථි ඇමදීම හා එකතු කරනු ලබන කසළ, නිවාස වලින් හා වාණිජ ස්ථාන වලින් ඉවත් කරනු ලබන කසළ බැංකියවත්ත දක්වා ප්‍රවාහනය, පොළ පවිත්‍ර කිරීම හා කසළ එකතු කිරීම, බස් නැවතුම්පොළ දිනකට දෙවරක් පවිත්‍ර කිරීම හා කසළ ඉවත් කිරීම, කාපට් මාර්ගවල වැලි ඉවත් කිරීම (නගර සභාවේන් සපයන ලද වාහන හා රියදුරන් යොදාගෙන) | රු. 10000.00 | රු. 1000.00 | රු. 122.00 | රු. 20.00 | රු. 1142.00 | රු. 2820000.00 |
| 08 | බස් නැවතුම්පොළ ගැහැණු හා පිරිමි පොදු වැසිකිළි ගාස්තු අය කර නඩත්තු කිරීම, මහජන පොළ පොදු වැසිකිළිය ගාස්තු අය කර නඩත්තු කිරීම | රු. 7500.00 | රු. 2500.00 | රු. 306.12 | රු. 51.02 | රු. 2857.14 | රු. 650000.00 |

අවම ලංසුවට අමතරව රජය විසින් පනවා ඇති වැට් හා ජාතිය ගොඩ නැගිමේ බදු මුදලද ගෙවිය යුතුය.

තෝරා ගන්නා ලද බදු කරුවන්ගෙන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක කොටසක් ලංසු කරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. ඉතිරි කොටස් දෙක එක වර ගෙවා 2013.12.31 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.

සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ අයිතිය බළන්ගොඩ නගර සභාව සතුය.

ඉහත යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

11:01:01 පසුගිය සභා වාරයේ දී යෝජනා වූ ක්‍රීඩාවට දක්ෂයින් තාවකාලිකව බඳවා ගැනීම පිළිබඳ නැවත ගරු සභාවට කරුණු කීම

***ගරු උප සභාපතිතුමා:***

*සභාවට ක්‍රීඩා දක්ෂතා ඇති අය තාවකාලික වශයෙන් බඳවා ගැනීම පිළිබඳ ගැටලුවක් නෑ. මෙය සභාවට ඉදිරිපත් කළ විට අප එහි පසුබිම දන්නේ නෑ. රාජ්‍ය සේවා ක්‍රීඩා තරග වලට ඉදිරිපත් වී ජයග්‍රහණය කිරීමයි අරමුණ. නමුත් මෙම සභාවේ දැනට ස්ථිර වීමට ද පිරිසක් සිටිනවා. සුදුසුකම් ඇති අයකුට රැකියාවක් දීම සම්බන්ධව ප්‍රශ්නයක් නෑ. මත්ද්‍රව්‍ය භාවිත කරන්නකුට රැකියාවක් දුන්නොත් ඔහු එය නතර කර රැකියාව කරනවා. සුදුසුකම් බලා බඳවාගෙන අවුරුදු 10-12 සේවය කළ අය සිටිනවා ස්ථිර වීමට. ඒ අයට යම් අසාධාරණයක් නොවන පරිදි මේ බඳවා ගැනීම් කරන ලෙසයි කරුණු පැහැදිලි කිරීමේ දී ඉල්ලා සිටින්නේ. ඒ අය වසර ගණනාවක් තිස්සේ අපට සහයෝගය දුන්නා.*

***ගරු සභාපතිතුමා:***

*අපගේ රජය විසින් තීන්දු කළ කාරණාව හොඳයි. බඳවා ගැනීමට පෙර නොතිබූ නිර්ණායක ඇතුළත් කළා ඒ අයට උසස් වීම් ලබා ගැනීමට. අද කම්කරුවාටත්, මුරකරුවාටත්, රියදුරාටත් ගණිතය සමත් වීම අවශ්‍ය වී තිබෙනවා. ඒ අයට විභාග වලට පෙනී සිට ඉහලට යෑමට හැකියාව තිබෙනවා. 16/1 චක්‍රලේඛය මගින් නැවැත්වුවේ නැති නම් මේ ගැටලු ඇති වන්නේ නෑ. 1997 සභාපතිවරයා වශයෙන් මා පත් වූ විට මෙහි සිටින මුණසිංහ, පේමදාස වැනි සේවකයන් ඉවත් කළේ නෑ. මුණසිංහ කම්කරුවකු වුවත් කාර්යාල කාර්ය සහායක බවට පත් වීමට කැමතියි. නමුත් එසේ බඳවා ගන්නා දිනයක් නිශ්චිත නෑ. ඔහු කාර්යාල කාර්ය සහායක වූ විට මෙම ආයතනයේ තබන්නේ නෑ. වෙනත් තැනකට මාරු කළ විට මෙම ආයතනයට කාර්යාල කාර්ය සහායකයාත්, කම්කරුවාත් අහිමි වනවා. තනතුර ඉහල ගියත් වැටුප ඉතාමත් සුළු ප්‍රමාණයයි වැඩි වන්නේ.*

***ගරු උප සභාපතිතුමා:***

*ගරු සභාපතිතුමන්ගේ හිතවත් අය, නෑදෑයො මේ සභාවේ සේවය කරනවා.*

***ගරු සභාපතිතුමා:***

*මගේ නෑදෑයො නෑ. මගේ දුවට පළාත් සභාවේ සුදුසුකම් මත පෙරපාසැල් ගුරු තනතුර දී තිබෙනවා. එය ලබා දුන්නේත් මම නොවෙයි.*

***ගරු උප සභාපතිතුමා:***

*ඔබතුමාත් මෙහි දීමනාවක් ගන්නවා.*

***ගරු සභාපතිතුමා:***

*දීමනාවක් ගන්නේ මගේ පුද්ගලික ලේකම්. පුද්ගලික ලේකම් වශයෙන් මට ඕනෑම කෙනෙක් පත් කර ගත හැකියි. හොඳින් ඉංග්‍රීසි දන්නා ඕනෑම තැනකට යැවිය හැකි නිසා මගේ දියණියට එම තනතුර දී තිබෙනවා.*

***ගරු උප සභාපතිතුමා:***

*සභාපතිතුමන්ගේ පවුලේ හතර දෙනෙකුම මෙම සභාවේ රැකියාව කරනවා. නමුත් ඔබතුමන්ට අවශ්‍ය අය බඳවා ගත්තාට මා විරුද්ධ වන්නේ නෑ.*

***ගරු සභාපතිතුමා:***

*මා ඔබතුමන්ගේ දියණිය බඳවාගත්තත් අවශ්‍ය සුදුසුකම් නොමැති නිසා ඉවත් කළා.*

***ගරු උප සභාපතිතුමා:***

*සුදුසුකම් මදි නම් එය බඳවා ගැනීමට පෙර සලකා බැලිය යුතුයි.*

11:02:02 බුලත්ගම පොදු සුසාන භූමි පාරට කුට්ටිගල් ඇල්ලීම පිළිබඳ අනුමැතිය ලබා ගැනීම

11:02:03 බලන්ගොඩ, කහටපිටිය පාර, අංක 51/04, දරන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ගව ඝාතකාගාරය මෙම නගර සභාවට පවරා ගැනීම

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා:***

*ගරු උපසභාපතිතුමන් මහා සභාව අමතමින්, පසුගිය මහා සභාවේ කාරක සභා අවස්ථාවේ දී මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා විසින් ප්‍රකාශ කළ පරිදි, මින් පෙර ගව ඝාතනාගාරය පිහිටා තිබුණේ, යශෝදරා අඳ ගොළු බිහිරි පාසැල අසළ බවත්, එම ස්ථානය එවකට බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්ව තිබූ බවත්, එයට විරුද්ධව අධිකරණයේ නඩුවක් පැවරුණු බවත්, අධිකරණයෙන් එය වසා දැමීමට නියෝග කළ බවත් ප්‍රකාශ කළේය. 1993.03.19 වන දිනැති බලන්ගොඩ නගර සභාවේ එවකට ගරු සභාපතිවරයා විසින් නිකුත් කරන ලද ලිපියක් උපුටා දක්වන ලදී. එම ලිපියෙන් එවකට ගරු සභාපතිතුමන් විසින් බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දන්වා ඇති පරිදි බලන්ගොඩ, මිරිස්වත්තේ කහටපිටිය පාරේ පවත්වාගෙන යනු ලබන ගවඝාතනාගාරය සම්බන්ධයෙන් ත්‍රි පුද්ගල කමිටුවක් පත් කර ඇති බව ද, එම ස්ථානය නිසි පරිදි සෞඛ්‍යාරක්ෂිත නොවන බැවින්, ඒ සඳහා විකල්ප ස්ථානයක් නම් කර දෙන ලෙස ඉල්ලා ඇති බව ද, සඳහන් කරන ලදී.*

*එයට පිළිතුරු වශයෙන් එවකට බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එවකට ගරු සභාපතිතුමන් වෙත එවන ලද පිළිතුරු ලිපිය උපුටා දක්වමින්, ගව ඝාතනාගාරය ඉදිකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇති බව ද, පත් කරන ලද ත්‍රි පුද්ගල කමිටුව, එවකට සිටි ග්‍රාම නිලධාරී ඒ. එම්. ෆාරුක් මහතා, මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී. සෙල්ලහේවා මහතා, වැඩ අධිකාරී පියදාස මහතා, යන තිදෙනාගෙන් සමන්විත වූ බව ද, ඒ වන විට එම කමිටුවේ නායකත්වය දැරීමට කෙනෙකු පත් කර නොමැති වූ බව ද, එම කමිටුව පත් කරන ලද්දේ ඉල්ලීමට අදාල සුදුසු ඉඩමක් සොයා දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව බව ද, ඒ අනුව එමඟ ඩම තෝරා ඉදිරිපත් කළ නොහැකි බැවින් මෙම සභාව විසින් දක්වන ලද ප්‍රකාශයක් බව ද, කමිටුව විසින් යෝජනා කරනු ලබන ස්ථානය මහජන අපහසුතා ඇති වන අන්දමින් ගව ඝාතනය සිදු වේ නම් හෝ එය නගර සභාවට අයත් බල ප්‍රදේශයක ඉඩමක පිහිටියේ නම් හෝ එය ඉවත් කිරීම සුදුසු බවත්, නගර සභාවේ ගව ඝාතනාගාරයට සුදුසු වෙනත් විකල්ප තෝරා රජයේ ඉඩමක් යෝජනා කිරීම ගැන ද දක්වා ඇති බව ගරු උප සභාපතිතුමන් විසින් දක්වන ලදී.*

*යශෝදරා අඳ ගොළු බිහිරි විද්‍යාලයේ විදුහල්පතිතුමන් විසින් එවකට පළාත් සභා ගරු අමාත්‍ය මොහාන් එල්ලාවල මැතිතුමන් වෙත 1996.02.02 වන දිනැතිව යවා තිබූ ලිපියක් ද උපුටා දක්වමින්, විද්‍යාලය අසළ ඉදිකර තිබූ ගව ඝාතනාගාරය ආරම්භ කළ අවස්ථාවේ සිටම එයට විරෝධය දැක්වූ බව ද, මේ සඳහා වන ලිපි ගොණුවක් ද විදුහලේ ඇති බව ද, එවකට ඇති වූ දේශපාලනික තත්ත්වය නිසා එය විද්‍යාලය අසළින් ඉවත් කර ගැනීමට නොහැකි වූ බව ද, ගව ඝාතනාගාරය හේතුවෙන් ඇති වී ඇති තත්ත්වය ඉතා කණගාටුදායක වූ බව ද, බල්ලන් විසින් මස් හා කටු කැබලි විද්‍යාල භූමියේ ගෙනැවිත් දමන ලද බව ද, දුර්ගන්ධය පැතිරී ඇති බව ද, කපුටන්ගේ ශබ්දය නිසා ඉගැන්වීම් කටයුතු කිරීමට අපහසු වූ බව ද, ආබාධිත දරුවන් ඝාතනාගාරයේ ක්‍රියාවන් අනුකරණය කළ බව ද, ගරු අමාත්‍යතුමන් විසින් සංවර්ධනය කර දුන් මාර්ගයේ ගමන් ගත්තේ මස් ලොරි බව ද, මේ කරුණු නිසා විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන්ට ලෙඩ රෝග බෝ වීමේ අවදානමක් තිබූ බව ද, සඳහන් කරන ලදී. අඳ ගොළු බිහිරි විද්‍යාලයේ විදුහල්පතිතුමන්ට මේ සම්බන්ධයෙන් නිර්නාමික දුරකථන ඇමතුම් මගින් තර්ජනයන් පැමිණියත්, ඔහු නැවතත් මේ සම්බන්ධව කටයුතු කරන බව ද එතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.*

*මෙහි දී සිදුව ඇත්තේ ස්ථානය තිබෙන දිශාව වෙනස් වීමක් පමණක් බව ද, මේ වන විට ගවයන් බැඳ තබන්නේ යශෝදරා අඳ ගොළු බිහිරි පාසැලේ ඉඩමේ බව ද, පසුගිය දිනෙක එහි බැඳ තිබූ ගව දෙනුන් දෙදෙනෙකු පසුව මස් බවට පත් කරන ලද බව ද, මෙහි දී තමන් විසින් සිදු කරන්නේ ගව ඝාතනයට විරෝධතාවය දැක්වීමක් නොව අමානුෂික අයුරින් ගවයින් ඝාතනය සම්බන්ධයෙන් විරුද්ධ වීමක් බව ද, පොලිසිය ඉදිරිපිට ඇති ඉඩම ලබාගෙන ගවයන් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ හැකි නම් ගරු සභාපතිතුමන්ට ස්තුතිවන්ත වන බව ද, ක්ෂය රෝගය, පාචනය වැනි රෝග වැළඳුනු ගවයින් හඳුනා ගත හැකි වුවත්, මෙතෙක්, එවන් ගවයකු මරා වලදැමීමක් ගැන අසා නොමැති බව ද, දැනට ඇති ස්ථානයේ ජලය ලබා ගැනීමටවත් ස්ථානයක් නොමැති බව ද, වතුර අදින්නේ කර මතින් බව ද, එම ස්ථානයේ අපද්‍රව්‍ය බැහැර කිරීමට පූතික ටැංකියක් නොමැති බව ද, වහලයේ වතුර පීල්ලෙන් ජලය එම ස්ථානයට එන බව ද, ගවයින් බැඳ තැබීමට තැනක් නොමැති බව ද, මැරීමට ගෙනයන ගවයා කපන ස්ථානයට පෙනෙන පරිදි ගෙන යාමට නොහැකි බව ද, මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් නොගත හොත් අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව ද ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී.*

*ගරු සභාපතිතුමන් මේ සම්බන්ධව අදහස් දක්වමින්, ගරු උප සභාපතිතුමන් මේ සම්බන්ධව සියළු සාධක දක්වමින් ඉදිරිපත් කිරීම සම්බන්ධව ප්‍රශංසා කරන ලද අතර, පෙර මෙම නගර සභාවේ ගෝ ඝාතකාගාරය පිහිටා තිබූ ගල් වල ඉඩමේ නැවත ගෝ ඝාතකාගාරයක් ආරම්භ කළ හැකි බව ද සඳහන් කරන ලදී.*

*මැරීමට ඇති ගවයන් ප්‍රදර්ශනය කරන ස්ථානය වශයෙන් පොලිසිය ඉදිරිපිට කොටස ලබා ගැනීමට හා පෙර මස් මඩුව පැවති ස්ථානයේ අලුතින් එය ආරම්භ කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.*

*එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.*

ඉහත 11:02:02 හා 11:02:03 සඳහා ද අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

11:03:01 ඌරු මස් කඩය ආරම්භ කිරීම සම්බන්ධව නැවත සාකච්ඡා කිරීම

මේ සම්බන්ධව පෙර සංවාදයට ලක් කර තීරණයක් ගන්නා ලදී.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 2013 ජූලි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය**

- 2013 අගෝස්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 5,235,224.88 |
| වෙනත් ලැබීම් | 906,172.59 |
| **මුළු ලැබීම්** | **6,141,397.47** |
| පුනරාවර්තන වියදම් | 4,562,468.67 |
| වෙනත් වියදම් | 1,485,218.27 |
| **මුළු වියදම්** | **6,047,686.94** |

- බලන්ගොඩ තානායමේ 2013.08.01 වන දින සිට 2013.08.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.07.01 සිට 2013.07.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන් හි ඉතිරිය සහ 2013.08.01 වන දින සිට 2013.08.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වාර්තාවන්**

2013.07.01 සිට 2013.07.30 වන දින දක්වා වාහන සඳහා පසුගිය සභාවට ඉදිරිපත් නොකළ ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව එම වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 164,443.10 කි.

2013.08.01 සිට 2013.08.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 709,438.05 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවන්ටට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

2013.10.20 වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 මුදල් කමිටුව**

2013.10.23 වන දින පැවති මුදල් කමිටු රැස්වීමේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

13:03 ආපදා කළමනාකරණ කමිටුව

2013.10.24 වන දින පැවති ආපදා කළමනාකරණ කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 කර්මාන්ත කමිටුව**

2013.10.29 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු:

**14:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූමි මැතිතුමා:**

ගරු සභාපතිතුමන් අමාත්‍යාංශයන් වෙත යාමේ දී තමන් කැඳවාගෙන යාම සම්බන්ධව ස්තුතිය පළ කරන බව ද, එයින් ඇති කරගන්නා ලද සම්බන්ධතා අනුව විශාල සංවර්ධනයක් බළන්ගොඩ නගරය වෙත ලබා දීමට හැකි වූ බව ද, ඇතැම් අමාත්‍යාංශයන් වෙත ගිය විට බළන්ගොඩ යන නම ප්‍රකාශ කළ විට නිමල් ගාමිණී වීරසිංහ යන නාමය ඔවුන් විසින් සිහිපත් කරන බව ද, එය බළන්ගොඩ නගරයට විශාල ආඩම්බරයක් බව ද, නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූමි මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම UN HABITAT ආයතනය විසින් පැවැත්වූ වැඩසටහනේ දී බළන්ගොඩ නගර සභාව වෙනුවෙන් සිදු කරන ලද කථාව සම්බන්ධව ගරු උප සභාපතිතුමන්ට ද ස්තුතිය පළ කරන බව ද, මෙම සභාවේ දී මත ගැටුම් ඇති වුව ද, පිටස්තර ආයතනයක් හමුවේ පෙනී සිටීමේ දී සියළු දෙනා සහෝදරයන් වශයෙන් කටයුතු කරන බව එතුමන් විසින් පෙන්වා දුන් බව ද, ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම තමන්ගේ විශේෂ ස්තුතිය මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙත හිමි වන බව ද, එතුමාගේ ඉදිරිපත් කිරීම් මගින් බළන්ගොඩ නගරයේ ප්‍රතිරූපය ශ්‍රී ලංකාවේ පමණක් නොව ජාත්‍යන්තර මට්ටමේ ද කීර්තියක් ලබා දී ඇති බව ද, එතුමාගේ ඉගැන්වීමේ ක්‍රම බංගලාදේශය වැනි රටවලින් පැමිණි ඉංග්‍රීසි භාෂාව නොදන්නා නියෝජිතයන් පවා දේශනය කෙරෙහි ඇද තබා ගැනීමට ඉවහල් වූ බව ද, බළන්ගොඩ නගරය ජාත්‍යන්තර මට්ටමේ ඉහලට ගෙනයාමට ගරු සභාපතිතුමන්ටත්, සභාවටත් ඒ මහතා විශාල ශක්තියක් බව ද, ගරු මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී. වෙනත් ආයතනයන් වෙත ගිය විට ද බළන්ගොඩ නගරයේ කසළ කළමනාකරණය ගැන මෙන්ම දක්ෂ මහජන

සෞඛ්‍ය පරීක්ෂකවරයකු සිටින බව ද ඇසීමට ලැබෙන බව ද, නොයෙක් විදේශ රටවල සංචාරය කොට උගත් දෑ මෙහි සංවර්ධනය පිණිස ඔහු විසින් යොදවන බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් නගර සභාවේ ලාංඡනය වෙනස් කිරීමට යෝජනා කළ ද, එතුමාගේ අවශ්‍යතාවය වූයේ ඒ සඳහා නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ලබා ගැනීම බව ද, එම යෝජනාව ඉදිරිපත් කළ විට එයට ප්‍රතිචාර ලැබුණු බව ද, සභාවේ දී එසේ වාද විවාද කිරීමෙන් අවසානයේ දී ප්‍රතිඵලය ලබා ගැනීම සිදුවිය යුතු බව ද, ගරු මන්ත්‍රීතුමන් සඳහන් කළේය.

බළන්ගොඩ නගර සභාව සියළුම අංශයන්ගෙන් කීර්ති නාමයක් ලබා ගන්නා බව ද, තමන් ක්‍රීඩා ගුරුවරයකු වශයෙන් බළන්ගොඩ නගර සභා ක්‍රීඩා සමාජය වශයෙන් අනෙක් සියළු අංශයන්හි කීර්ති නාමය ඉහලට රැගෙන යාමට හැකි වනු ඇති බවට එතුමන් විශ්වාසය පළ කරන ලදී.

ජාතික මට්ටමෙන් මෙම නගර සභාවේ පුස්තකාලයට තුන්වන ස්ථානය ලැබීම පිළිබඳව නගර සභාවේ ගරු සභාපතිතුමන්ටත්, පුස්තකාල උපදේශක කමිටුවේ ගරු සභාපති හා නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාටත්, එයට සහයෝගය ලබා දෙන සියළුම නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාටත් තම අවංක ආදර ස්තුතිය පළ කරන බව ද, පුස්තකාලය මේ තත්ත්වයට ඔසවා තැබීමට නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් සියළු දෙනා ඒකරාශි කරමින් දැඩි කැපවීමක් කළ බව ද එතුමන් සිහිපත් කරන ලදී.

එමෙන්ම සබරගමුව පළාතේ සභාපති සම්මේලනයේ අධ්‍යක්ෂක තනතුර ගරු සභාපතිතුමන්ට හිමිවීම පිළිබඳ සතුටට පත් වන බව එතුමන් ප්‍රකාශ කරන ලදී.

බළන්ගොඩ ජෛලානි ජාතික පාසැලේ මාර්ගය සෑදීම සඳහා රු. ලක්ෂ 12.5ක් ලබා දීම පිළිබඳව පළාත් සභා හා පළාත් සභා ගරු අමාත්‍ය අතාඋල්ලා මැතිතුමන්ටත්, ගරු සභාපතිතුමන්ටත් ස්තුතිය පළ කරන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විදේශ සංචාරයන්හි නිරතවීම සම්බන්ධව තමන් දැඩි සතුටට පත් වන බව ද, එතුමන් කවර ස්ථානයකට ගිය ද හිස් අතින් නොපැමිණෙන බව ද, පසුගිය දා පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා මැතිතුමන් සමඟ ගරු සභාපතිතුමන් හා තමන් පැය දෙකක සාකච්ඡාවකට සම්බන්ධ වූ බව ද, එතුමා මෙම සභාව වෙනුවෙන් ඩබල් කැබ් රථයක් ලබා දීමට අනුමැතිය පළ කළ බව ද, එමෙන්ම එතුමාගේ පෞද්ගලික ධනයෙන් යම් පරිත්‍යාගයක් සිදු කර මෙම නගර සභාව සමඟ සම්බන්ධතාව ඇති කර ගැනීමට ද කටයුතු කරමින් මෙම සංවර්ධනය ලබා දෙන බව ද, ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

විදුලි කාන්දුවක් හේතුවෙන් බළන්ගොඩ නගරයේ ඇති වූ ගින්න අවස්ථාවේ දී නගර සභාවේ ගරු සභාපතිතුමන්, උප සභාපතිතුමන්, මන්ත්‍රීතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය ක්‍රියා කළ ආකාරය සම්බන්ධව නගර වාසීන් කතා කරන බව ද, එම අවස්ථාවේ තමන්ට හැකි සෑම අයුරින්ම එය සමනය කිරීමට එතුමන් ක්‍රියා කළ බව ද, එසේ නොවූයේ නම් පැය කිහිපයක් ඇතුලත ගින්නෙන් විශාල විනාශයක් සිදු වීමට තිබූ බව ද සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් සිදු කරන සියළුම යහපත් දේට සෑම විටම සහයෝගය ලබා දෙන බව ද නගර සභා ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමන් විදේශගතව සිටින අවස්ථාවේ දී පූජ්‍ය මාවරලේ භද්දිය ස්වාමීන් වහන්සේ වැඩමවා ධර්ම දේශනයක් පැවැත්වීමට අවස්ථාවක් ලැබුණු බව ද, එම අවස්ථාවේ

දී තමන් සහ ලේකම්තුමිය ඇතුළු නගර සභාවේ කාර්ය මණ්ඩලය එක්ව එම අභියෝගය භාර ගත් බව ද, ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම්තුමිය ඇතුළු නගර සභාවේ කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන බව ද ගරු උප සභාපතිතුමන් සභාව අමතමින් ප්‍රකාශ කරන ලදී.

තමන් UN HABITAT ආයතනයේ සමුළුවකට සහභාගී වූ බව ද, එම ස්ථානයේ දී, ආපදා කළමනාකරණ ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා, ඔස්ට්‍රේලියානු මහකොමසාරිස්තුමිය ඇතුළු පිරිස ඉදිරියේ දී ඉංග්‍රීසි භාෂාවෙන් සමුළුව ඇමතූ බව ද, එයට සහභාගී වූ පළාත් පාලන ආයතන 04 අතරින් පළාත් පාලන ආයතන ප්‍රධානියකු වශයෙන් කතාව සිදු කළේ තමන් පමණක් බව ද, එහි දී ගරු සභාපතිතුමන්ගේ දේශපාලන නායකත්වය හේතුවෙන් ඇති වූ පෙරළිය ගරු සභාපතිතුමන් විසින් සිදු කළ බව ප්‍රකාශ කරන ලද බව ද දක්වන ලදී. ගරු සභාපතිතුමන් තමන් හට බලය පවරා හෝ නොපවරා දිවයිනෙන් බැහැර ගිය සෑම අවස්ථාවකම තම යුතුකම උපරිමයෙන් ඉටු කරන ලද බව ද එතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

තමන් සෑම අවස්ථාවක දීම ගරු සභාපතිතුමන් හට ප්‍රමුඛත්වය දී කතා කළ ද ගරු සභාපතිතුමන් වචනයෙන් මිස ප්‍රායෝගික ක්‍රියාවෙන් තමන් සම්බන්ධව එසේ නොකරන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. ඕනෑම පියකු දරුවන් රැකියාවක් කරමින් සතුටින් ජීවත් වනු දැකීමට කැමති බව ද, තම පියා ද තමන්ට වයස අවුරුදු හතේ දී හැර ගිය බව ද, මෙවන් තැනකට පැමිණිය හැකිවෙතැයි කිසි දිනෙක නොසිතූ බව ද, තමන්ට ද දරුවන් තිදෙනෙකු සිටින බව ද, තම වැඩිමහල් දියණිය මෙම ආයතනයේ පුස්තකාලයට සම්බන්ධ රැකියාවක් සඳහා භාර දුන්නේ නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් බව ද, තම දියණිය ලබා ගත්තේ පළමු වැටුප පමණක් බව ද සඳහන් කරන ලදී. පුස්තකාලයේ නොයෙකුත් උත්සව අවස්ථාවන්ට ආරාධනා ලැබුන ද තමන්ට එම ස්ථානයට යාමට අපහසු බව ද, එසේ ගිය විට තම දියණිය සාරියක් හැඳ එහි සිටිනු මැවී පෙනෙන බව ද, ඇය එයින් ඉවත් කිරීමෙන් තමන්ට දැඩි සිත් වේදනාවක් ඇති වූ බව ද, එබැවින් තම දරුවන් තිදෙනා හට කිසි දිනෙකවත් දේශපාලඥයකු වෙතින් රැකියාවක් ලබා නොදෙන බවට තීරණය කර ඇති බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී. බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ට මෙය දැන්වූ පසු එහි පුහුණුව සඳහා තම දියණිය බඳවා ගත් බව ද, ගරු සභාපතිතුමන්ගේ පවුලේ සතර දෙනෙකු මෙහි දීමනා ලබන විට තම දියණියට එම අවස්ථාව නොලැබීම සම්බන්ධව වේදනාවක් ඇති බව ද ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමන් ද පියකු වශයෙන් එය තේරුම් ගත යුතු බව ද සඳහන් කරන ලදී.

සභාපතිතුමන් තමන්ට කෙතරම් දොස් නැගුව ද, උප සභාපතිකම අහිමි වුව ද සතුටින් ගෙදර යාහැකි පුද්ගලයකු බව ද, ධර්මානුකූලව ජීවත් වන තමන් ඒ සම්බන්ධව දුකට පත් නොවන බව ද, තමන් පෙර සතුන් මැරීම ආදී වැරදි සිදු කළ බව ද ඒවාට විපාක ලැබී ඇති බව ද, තම ශරීරයේ නොයෙකුත් ශල්‍යකර්මයන් සිදු කිරීමට හේතු වූයේ එය බව ද, මේ බව දැනගත් විට තමන් පවෙන් මිදුනු බව ද, වරදින් මිදීමට වෙනත් ප්‍රදේශයකට ගිය ද හෘදය සාක්ෂියෙන් මිදීමට හැකියාවක් නොමැති බව ද, එතුමන් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙම සභාව ඉතාමත් හොඳින් පවත්වාගෙන යන බව ද, එය ඉහල තැනකට ගෙන ඇති බව ද, තමන්ට ද උරුම වී ඇත්තේ ගරු සභාපතිතුමන්ගේ එම දක්ෂතාව බව ද, නගර සභා ගරු මන්ත්‍රීතමන්ලා ද දක්ෂ බව ද, එතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

තමන් රාජ්‍ය සේවා ක්‍රීඩා තරගාවලියට සහභාගී නොවූයේ රැකියාව හේතුවෙන් බව ද, තම පියා හෝ තමන් නගර සභාවෙන් අඹුදරුවන් පෝෂණය නොකළ බැවින් සහ ඉදිරියට ද එසේ නොකරන බැවින් එසේ ජීවනෝපායක් කිරීම අවශ්‍ය බව ද නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් මහා සභාව අමතමින් ප්‍රකාශ කරන ලදී. ප්‍රතිපත්ති, තීන්දු, තීරණ ගැනීමේ දී සෑම විටම නගර සභාවත් සමඟ සිටින බව ද, ක්‍රීඩා තරගාවලියට සහභාගී වීමේ දී අතපසුවීමක් සිදුවූවා නම් සමාව අයදින බව ද එතුමන් සඳහන් කරන ලදී.

මෙම නගර සභාවේ පුස්තකාලය දිවයිනෙන්ම තෙවන ස්ථානයට පත් කිරීමට දායක වූ ගරු සභාපතිතුමා, නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ, එම්. ටී. එම්. රූමි, එම්. ජේ. මලික් ෂා යන මැතිතුමන්ලා, ලේකම්තුමිය සහ පුස්තකාලයාධිපතිනිය ඇතුළු කාර්ය මණ්ඩලයට තම ස්තුතිය ප්‍රකාශ කරන බව ද සඳහන් කළ ගරු මන්ත්‍රීතුමන් සභාව තව තවත් ඉදිරියට ගෙන යාමට ගරු සභාපතිතුමන්ට ශක්තිය ධෛර්යය ලැබීමට ප්‍රාර්ථනා කළේය.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමන්ගේ නායකත්වය යටතේ මහජන පුස්තකාලය වෙත දිවයිනේ තෙවන ස්ථානය ලබා ගැනීමට පුස්තකාල කමිටුව, පුස්තකාලයාධිපතිනිය සහ ලේකම්තුමියගේ පූර්ණ සහයෝගය මත හැකි වූ බව ද, ගරු සභාපතිතුමන් විදේශගතව සිටින විට පුස්තකාලය වෙනුවෙන් කියවීම් මාසයේ දී සිදු කළ යුතු සියළු සේවාවන් ඉටු කළ බව ද, ඒ හේතුවෙන් මෙම ජයග්‍රහණය ලැබූ බව ද, පුස්තකාල කමිටුවේ සාමාජික නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා, එම්. ජේ. මලික් ෂා මැතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ දායකත්වය ඒ සඳහා ලැබුණු බව ද, එමෙන්ම කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් ඒ සඳහා සක්‍රීයව දායකත්වය ලැබුණු බව ද, ත්‍යාග ප්‍රදානයේ දී ද දායකත්වය ලබා දුන් බව ද සඳහන් කරන ලදී.

අද දින මහා සභාව ඉතා සාර්ථකව පැවති බව ද, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා ඉතා හොඳින් අදහස් ප්‍රකාශ කරන ලද බව ද සඳහන් කරන ලදී.

මෙම සභා ලාංඡනයයේ ඇති ශ්‍රී පාදස්ථානයේ ලාංඡනය ඉවත් කිරීම අවශ්‍ය නොවන බව ද, නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් ද ප්‍රකාශ කළ පරිදි තානායම සඳහා වෙනත් ලාංඡනයක් සැකසීම කළ යුතු බව ද එතුමන් සඳහන් කරන ලදී.

ළමා උද්‍යානයේ කටයුතු අවසන් වෙමින් පවතින බැවින් ගරු සභාපතිතුමන් ඇතුළු සියළුම නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා හට එහි පැමිණ අඩුපාඩු ඇතොත් පෙන්වා දීමට එතුමන් විසින් ආරාධනා කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

කාර්ය සාධන තරගයේ දී නගර සභාවට ලකුණු ප්‍රමාණයක් අහිමි වීම මත පනතේ ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරීමේ යෝජනාව ගෙන ආ බව ගරු සභාපතිතුමන් නැවතත් සිහිපත් කරන ලදී. කණ්ඩායම් රැස්වීම් වල දී මේ සම්බන්ධව සංවාදයට ගැනීම සුදුසු බව එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

සෑම විටම මහා සභා රැස්වීම් වල දී කතා කළ යුත්තේ නගර වාසීන්ට කළ හැකි සේවාවන් පිළිබඳ පමණක් බව ද, වෙනත් කරුණු සංවාදයට ගැනීමෙන් ඵලක් නොමැති බව ගරු සභාපතිතුමන් සඳහන් කරන ලද අතර, න්‍යායපත්‍රානුකූලව සභා රැස්වීම පැවැත්වීමට හැකි නම් ඒ සඳහා ගත වන කාලය ද අඩුවන බව ද සඳහන් කරන ලදී.

දැනට මෙම සභාවේ ක්‍රීඩාපිටිය පුරවා සකස් කිරීම කළ යුතු බව ද, ඒ සම්බන්ධව කඩිනමින් කටයුතු කළ යුතු බව ද, එය පසුගිය කර්මාන්ත කමිටුවේ අනුමත වී ඇති බව ද ගරු සභාපතිතුමන් සඳහන් කළ අතර, සභාවේ කටයුතු සඳහා සහයෝගය දුන් සියළු දෙනාට ස්තුති කරන ලද අතර, මහා සභාවේ වැඩකටයුතු ප. ව. 1.30ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.